

# වනබිම සැරිසර



නිමල් සේදර

## වල අලියෙක් ඇගේ හැප්පෙයි

රක්වානේ සදගිරිය ඓතිහාසික වටිනාකමින් යුතු පැරණි සිංහල රජදරුවන්ගේ පහස ලද බිමකි. වළගම්බා රජ්ජුරුවෝ තමන්ගේ ආරක්ෂාවත් දළදා වහන්සේගේ ආරක්ෂාවත්, පතා සැගවී සිටි බිම සදගිරිය යි. චන්දන ග්‍රාම, සඳගිරිය සහ සඳගිරිය යනුවෙන් හදුන්වනු ලබන අප කතාකරන සදගිරිය හේන් ගොවිතැනින් කෘෂිකර්මයෙන් දිවිපෙවෙත රැක ගන්නා ජනයාගෙන් ද රුස්ස වනපෙතකින්ද යුක්තය. ඔවුන්ගේ වගාවන් ආරක්ෂාකර ගැනීමට වන සතුන් ලෙස සැලකියයුතු සටනක් කල යුතු අතර ඌරා, ගොනා, මුවා පමණක් නොව වල්අලියා සමගද මේ සටන කල යුතු වන්නේය. වන සතුන් නිතර දැකීම සහ ඔවුන් සමග නිතර ගැටීම නිසා ඔවුන්ට ඇතිබිය ගොවියන් හා දඩයම්කරුවන් තුළින් පහවී ගොසින්ය. වන සතුන් සමග සටන හේන් ගොවිතැනම කොටසකි. දඩ මසද වරදින හේනක් නැත.

සදගිරියේ පීටර් අයියා ඉතා දක්ෂ වෙඩික්කාර ලෙස ප්‍රකටය. වනපෙත බොහෝ කලක් ඇසුරු කිරීම නිසා ඔහු වන සතුන්ගේ චර්යා හොදින් හදුනයි. අහරට පැමිණෙන වේලාව, පිටව යන වේලාව, දියට යන වේලාව ඔහු දනියි. අලියාගෙන් බේරෙන්න ටත් පිඹුරාගෙන් බේරෙන්නටත් අනුගමනය කළයුතු විවිධ ක්‍රියා කලාපයන්ද දනියි.

සදැගිරියේ හේන්වල ඒ වාරයේ වෙනදටත් හොදින් කරගත් කිරි වදිමින් තිබුණි. වැඩි අස්වැන්නක් ගැන කවුරුත් බලාපොරොත්තු තැබුහ. එහෙත් අවාසනාවකට මෙන් වනපතෙන් එළි යට එන එක්තරා තනි අලියෙක් පීදෙන කුරක්කන් විනාශ කරන්නට පටන් ගත්තේය. කනවාට වඩා අලියාගේ යෝධ පාද වලට පෑගි විනාශ වී යයි. එපමණක් නොව මේ අලියා යම් දවසක හේන් යායේ පැල් පතකින් ලුණු කා රසවැටුණෙක විය. මේ නිසා තත්වය වඩාත් දරුණු අතට හැරුණේය. මේ අලියා වලිගය කොටෙක් විය. කවුරුත් වලිග කොටාගේ කරදරයෙන් කම්පනයට පත්ව සිටියහ. හේන් යායේ පැල්පත් කිහිපයක්ම ලුණු කෑම සඳහා විනාශ කරදැමීමට වලිග කොටා කටයුතු කළේය.

වලිග කොටාගේ කරදරයට කෙළවරක් තිබිය යුතුය. පීටර් අයියත් කුලුපග තවත් සගයෙකුත් මේ තර්ජනය නිමකිරීමට ඉටාගත්හ. සවස කල්තියාම තුවක්කු දෙකක් දෙකක් සුදානම් කරගත් මිත්‍රයෝ දෙදෙන වලිග කොටා එන යාමේ හේනට යන්නට සූදානමින් සිටියහ. අඳුර රජවෙමින් තිබුණි. ඈතට විසිර ගිය හේන්යායේ තැන තැන දැල්වෙල පුංචි ගිණිමැල දැක්ක හැකිය. සිහින් සඳ එළියක් පොළොව මත පතිත වෙයි. පීටර් අයියා සිය මිත්‍රයන් සමග හේන් යාය කෙළවර වනපෙත අසබඩට සමීප වී බලාසිටියේය. සුළග ගෙනා පණිවිඩය අනුව අලියා අත ළගම එනබව පීටර් අයියා දැනගත්තේය. දෙදෙනාම සිතින් හඩින් කතාබහේ නිරත විය. වැඩිවෙලාවක් යන්නට පෙර අඳුරු ඡායාවක් පරිදි අලියා වනපෙතේ ලඳු කැළෑවක් අතර දිස්විය. අතුකොළ පීදෙන හඩපවා සිහින්ව ඇසෙන තරම්ය.

පීටර් අයියත් මිත්‍රයත් දෙපසකින් අලියා වෙත සමීප වීමට තීරණය කර ගත්හ. තීරණය අනුව දෙදෙනා දෙපැත්තකට බෙදී ගියේ අමොරාගත් ගිනිකදයා ගැන පූර්ණ විශ්වාශයෙනි. දෙදෙනා හිමින් සීරුවේ දෙපැත්තකින් පියවර මනිමින් අලියා සිටින ඉසව්වට ළගාවීමට පටන් ගත්හ. අඳුරේ සුළං පාර මඟහරින්ම හඩක් නොනැගෙන පරිදි ඉදිරියට යෑම පහසුකාරියක් නොවීය. කෙසේ වෙතත් වන ලැහැබ හුරු දෙදෙනා ඒ දුෂ්කර කාරිය ඉටුකළහ. ඔවුන් අලියා වෙත සමීපවූයේ බඩගාගෙන මෙන් ගමන් කරමිනි.

දැන් පීටර් අයියාට හස්තිරාජයා පැහැදිලි වම පෙනේ. එහෙත් කුරුමානම නො වරද්දනට තවත් යාර කිහිපයක් ඉදිරියට යායුතුය. බඩගාගෙන මෙන් යමින් ඔහු එය ඉටුකර ගත්තේ ය. මිත්‍රයා ද දැන් අලියා සිටින ඉසව්වට ඔහුට දුන් උපදෙස් පරිදි සමීපව ඇතිබව ඔහු අනුමාන කළේය. සතුරා තමාවෙත සම්පවෙන බවට හෝඩුවාවක් අලියා දැනගත් බවට කිසිදු සංඥවක් නැත. එසේ කලබල වී නම් ඇති වන වෙනස පීටර් දනී.

දැන්නම් වෙඩි තබන්නට සුදුසුම දුර පරතරයයි. එහෙත් වාඩි වී වෙඩි තබන්නට නොහැකිය. ඊයක් මෙන් ක්ෂණයකින් නැගීසිට හරියටම හිසට කුරුමානම් ගෙනකොකා ගෑස්සිය යුතුය. දැන් සියල්ල ඉටුවන්නට වේලාව හරිය. පීටර් අයියා ගිනිකඳයාගේ කොකාට ඇඟිල්ල තබාගෙ නම නැගිසිටියේය. එහෙත් සිදුවුයේ අනපේක්ෂිත දෙයකි. සියල්ල සිදුවන්නට ගත වූයේ තත්පර කිහිපයකි. තත්පර කිහිපයක් තුළ කොපමණ දේ සිදුවන්නට හැකිද? ඔහු නැගිටනවාත් සමගම කිසියම් දෙයක ඔහුගේ හිස වැදුණේය. එය ලීයක් නොවේ. ගලක්ද නොවේ ගසක අත්තක් ද නොවේ. පිඹුරෙකුගේ දර්ශනයක්ද නොවේ. ඔහු නැගි සිටිත්දීම හැපුණේ තවත් වල් අලියෙකුගේ යටිතල්ලේය. ඒ වල්අලියකු බව අවබෝධවන්ට ද ගතවුනේ නිමේෂයකි. ගත යුතු පියවරක් ගැන සිතන්නට වෙලාව ක් නැත. අඳුරේම පීටර් ඉදිරියේ සිටින වල්අලියාට කුරුමානම් අල්ලාගෙන යද්දි ඔහු පිටිපසින් පැමිණියේ වල්අලියෙකි. බිමදිගේ ඉඳගෙන සහ බඩගාගෙන පැමිණි නිසා වල්අලියාට පීටර් අයියා හසුනොවිය. එහෙත් වල්අලියා හතුරගේ ඉවපසු පස පැමිණියේය. අවධානය වෙනතක තිබුණු නිසා පීටර්ට ඒ ඉව දැනුනේ නැත. පීටර්ගේ හිස අලියාගේ යටිතල්ලේ වදිනවාත් සමගම ඒ වල්අලියකැයි අවබෝධ වෙනවාත් සමගම පීටර් අතේ තිබුණු තුවක්කු ව ඉබේම ඉහලට පත්තු විය. වෙඩිහඩත් සමග හිසේ හැපුණු වල්අලියා මරහඩතලා ගෙන පූර්ව වාසනාව කට මෙන් ආපස්සට හැරී වනපෙත දෙවනත් කරගෙන දිව්වේය. වල්අලියා ඉදිරියටම දිව්වෙනම් පිටර් යට වී මැරෙයි.

එක් අලියකු වනපෙත කදු වද්දි පීටර්ලා කුරුමානම් කළ වල්අලියා විදුලි වේගයෙන් ක්‍රියාත්මකවිය. ඌ ඉදිරියට පැන පීටර්ගේ බඳවටා හොඩවැල දවටා ඈත වදුල්ලකට විසි කළේය. ඒ මොහොතකින් තවත් වෙඩිල්ලක් පත්තු විය. ඒ සිය මිතුරා බව ඔහු දැන ගත්තේ ය. එහෙත් නිමේෂයකින් තම මිතුරාද තමන් සිටි ලන්දටම උඩින් ඇවිත් වැටුනේය. ඔහුට සිදුවු දෙයද ඔහු අවබෝධ කර ගත්තේය.

දෙදෙනාම දැන් නිරායුධව සිටිති. ඔවුන් අත තිබුණු අවි දැන් අලි ඇතුන්ට අයත්ය එරමිනියා වදුලක වැටී අඳුරේ අහස් එළියෙන් ලොව දකින මේ මිත්‍රයින් දෙදෙනා වේදනාවෙන් පීඩා විඳිමින් සිටියහ. අලියා වලිග කොටා ද පලාගිය බවක් ඔවුන් විශ්වාස කළද සිදුවී තිබුණේ අනෙකකි. වලිග කොටා එතැනම සිටියේය. ඌ හෙමින් සැරේ ලන්ද පාගමින් ප්‍රතිවාදින් සොය න්නට විය. අලියාගේ කුංචනාදයත් ලන්ද පොඩිකරන්නට දරණ ප්‍රයන්තයත් ඔවුන්ට දැනුනි. බුද්ධිමත්ව කටයුතු කරමින් වදුලතුල පරිස්සමින් එහාට මෙහාට වෙමින් අලියා මග හරිමින් වේදනාව අමතක කර ගැනිමට දෙදෙනාම සමත් වූහ.

බොහෝ වේලාවක් එහි රැදුණු වලිග කොටා ජයග්‍රාහකව ආපසු වනපෙතට ඇදුණේය.



**සන්නස ගැන ඔබේ අදහස් අපට ලියන්න.**

Sannasa, Suite 504, 530 Little Collins Street, Melbourne 3000

Via Sannasa Website: Visit www.sannasa.com.au

## කවියෝ කියන වග

වතුරද බොමින් කොළඹට ගිය අගුරු — කකා
සේවය කළා සැමටම ඒ යකඩ — යකා
අදමිටු කුහක මිනිසුන් තම මඩිය — තකා
වනසා දමා ඇත ඒ සිහිවටන — මකා
වතුරද බොමින් කොළඹට ගිය අගුරු — කකා
සේවය කළා සැමටම ඒ යකඩ — යකා
අදමිටු කුහක මිනිසුන් තම මඩිය — තකා
වනසා දමා ඇත ඒ සිහිවටන — මකා

වෙත්තසිංහ

